- *මේ කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම ඔබගේ වගකීමකි.*
- *මෙම කාර්යය සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*
- විද්‍යුත් පැතුරුම්පත් පාඩම අධ්‍යනය කරමින් පහත ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- *ඔබේ පිළිතුරු හෝ නිර්මාණ අප්‍රේල් මස **පළමු සතිය-ICT- ඔබේ නම හා ශ්‍රේණිය** ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස්කරන්න.*

(1) ඔබ නිවසේ ගත කරන මෙම කාලය තුළ කොතරම් කාලයක් අධ්‍යාපනය සඳහා යොදවනවාද? ඔබ මුලින්ම පහත දක්වා ඇති ආකාරයට පැතුරුම්පත A4 කොළයක නිර්මාණය කර ගන්න.

	A	B	C	D	E	F	G	H	I	J	K	L
1												
2					සතිය තුළදී අධ්‍යාපනයේ යෙදුණු කාලය							
3												
4		සඳුදා	අඟහරුවාදා	බදාදා	බ්‍රහස්පතින්දා	සිකුරාදා	සෙනසුරාදා	ඉරිදා	සතිය තුළ අධ්‍යාපනයේ යෙදුණු මුළු පැය ගණන	වැඩිම කාලයක් අධ්‍යාපනය ලැබූ දිනයෙහි පැය ගණන	අඩුම කාලයක් අධ්‍යාපනය ලැබූ දිනයෙහි පැය ගණන	
5	දිනකදී අධ්‍යාපනයේ යෙදුණු පැය ගණන											
6	දිනකදී අධ්‍යාපනයේ යෙදුණු පැය ගණන (මිනිත්තු වලින්)											
7												
8												

(i) එක් එක් දිනයන්හි ඔබ අධ්‍යාපන කටයුතු වල නිරත වන පැය ගණන් සඳහන් කරමින් මෙම පැතුරුම්පත සම්පූර්ණ කරන්න.

(ii) සතිය තුළ අධ්‍යාපයේ යෙදුණු මුළු පැය ගණන,වැඩිම සහ අඩුම කාලයක් අධ්‍යාපනයේ යෙදුණු දිනයෙහි පැය ගණන සොයන්න.(මෙහිදී ඔබ විද්‍යුත් පැතුරුම්පතක් නිර්මාණයේදී කෝෂ තුළ ලබා දෙන සූත්‍රයද සඳහන් කළ යුතුයි.)

(iii) සතිය පුරා දිනයන් වලදී අධ්‍යාපනයේ යෙදුණු පැය ගණන් සහ සතිය තුළ අධ්‍යාපනයේ යෙදුණු මුළු පැය ගණන මිනිත්තු වලට හරවා ලියන්න .(මෙහිදී ඔබ විද්‍යුත් පැතුරුම්පතක් නිර්මාණයේදී කෝෂ තුළ ලබා දෙන සූත්‍රයද සඳහන් කළ යුතුයි.)

(iv) ඔබ නිර්මාණය කල පැතුරුම්පතට අදාළ ස්තම්භ ප්‍රස්ථාරය(Column Chart) A4 කොළයක නිර්මාණය කරන්න.